# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,531 — 1965 ඔක්තෝබර් 11 වැනි සඳුද — 1965.10 11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල අතිරේක (විධිවිධාන) පනත

අංක 1112 බී දරන පැවරුම් නියෝගය

යා/යාපනේ මධ්‍ය විද්‍යාලය, යාපනය

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත්, ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, මීට යාකොට දැක්වෙන උපලේඛනයෙහි විශේෂකොට විස්තරකොට ඇත්තාවූ ද, පවරා ගනු ලැබිය හැකිවූ ද දේපල සියල්ලම, 1965 නොවැම්බර් මාසයේ 1 වෙනි වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි රජයට පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

#### උපලේඛනය

යා/යාපනයේ මධ්‍ය විද්‍යාලය පවත්වා නඩත්තුකර ගෙන යාම සම්බන්ධවූ හා ඒ පිළිබඳ අනියම් කාර්යයන් සඳහා පාවිච්චි කරන ලද්දා වූ ද, පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබුවාවූ ද CV 700 ලියාපදිංචි අංකය දරන මෝටර් බස් රථය හා එයට අයත් සියළුම කොටස් හා උපකරණ ඇතුළුව.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/481.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,කොළඹ 3.
1965 ක් වූ ඔක්තෝබර් මස 4 වැනි දින දී ය.

10–546/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

කො/මහරගම බෞද්ධ විද්‍යාලය, මහරගම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ මැයි මාසයේ 14 වෙනි දින අංක 13,109 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 වර්ෂයේ මැයි මාසයේ 10 දාතමින් යුත් අංක 1244 දරණ පැවරුම් නියෝගය මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොලවලට අදාලවන තාක් දුරට 1965 වර්ෂයේ නොවැම්බර් මාසයේ 1 වෙනි දින සිට බලපැවැත් වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/619.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 වැනි දින දී ය.

#### උපලේඛනය

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ පල්ලෙ පත්තුවේ මහරගම පිහිටියාවූත්, බලයලත් මිනින්දෝරු හා මට්ටම්කරු වී. ඒ. එල්. සේනාරත්න මහතා විසින් සකස් කරන ලද 1952 පෙබරවාරි මස 17 වෙනි දින අංක 315 දරන පිඹුරෙහි " 3 " කොටස වශයෙන් දක්වා ඇත්තාවූත්, උතුරින්, එකී අංක 315 දරණ පිඹුරෙහි අංක " 13 " කොටස වශයෙන් දක්වා ඇති පාරක් සඳහා වෙන්වූ ඉඩම් තීරුවෙන් ද, නැගෙනහිරින්, එකී අංක 315 දරණ පිඹුරෙහි " 4 " කොටස වශයෙන් දක්වා ඇති බිම් කැබැල්ලෙන්ද, දකුණින්, කිරිපැල්ලගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩමෙන්ද, බටහිරින්, එකී අංක 315 දරණ පිඹුරෙහි " 1 " හා " 2 " කොටස් වශයෙන් දක්වා ඇති බිම් කැබැලිවලින් ද මායිම්වූන් රූඩ එකක් (අ. 0, රූ. 1, ප. 0) විශාලවූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

10–546/2

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

මහ/කහල්ල බෞද්ධ බාලිකා පාසල, කටුගස්තොට

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ය ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාය විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, ක්‍රියාකරමින්, 1962 වර්ෂයේ දෙසැම්බර් මස 27 වෙනි දින අංක 13,450 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 වර්ෂයේ දෙසැම්බර් මස 17 වෙනි දාතමින් යුත් අංක 2378 දරණ පැවරුම නියෝගය, මෙහි පහත සඳහන්

1487—ආර් 9437—6,675 (65/10)

වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොල වලට අදාල වනතාක් දුරට, 1963 වර්ෂයේ ජනවාරි මස 15 වෙනි දින සිට බලපැවැත් වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅක/121/සාපා.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 දින දී ය.

උපලේඛනය

" 1. මධ්‍යම පලාතේ, පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, නවයාලතැන්නෙහි පිහිටි නවයාලතැන්නහේන නමින් හැඳින්වෙන්නාවූත්, උතුරෙන්, බී. ඇම්. ඒ. අකුරුස්ස මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන ඉඩමෙන්ද, නැගෙනහිරෙන්, බලයලත් මිනුම් දෝරු තැන්පත් එච්. පානබොක්කෙ මහතා විසින් සකස් කරණ ලද අංක 3,821 හා 65.1.19 දින දරණ සැලැස්මෙහි ඉඩම් කැබෙලි අංක 2 දරණ ඉඩමෙන්ද, දකුණෙන් හා බටහිරෙන්, නවයාලතැන්නහේන නමැති ඉඩමේ ඉතිරි කොටසින්ද, මායිම්වූත් ප්‍රමාණයෙන් වර්ග අඩි 2,400 ක් පමණ වන අඩි 80 ක් දිග හා අඩි 30 පළල වූ ඉඩම් කොටස ක්‍රීඩා පිටියක් වශයෙන් සැමකල්හිම පාවිච්චි කිරීමේ පූර්ණවූත්, නිර්බාධිතවූත් අයිතිය හා බලය. "

10–546/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය යි

### හලා/වෙන්නප්පුව (රෝමානු කතෝලික) සිංහල බාලිකා පාසැල

### හලා/වෙන්නප්පුව (රෝමැනු කතෝලික) සිංහල ළදරු පාසැල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේ ලාගේ රපියල් අභයවන්ශ ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ අගෝස්තු 15 වෙනි දින අංක 13,262 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1769 දරණ පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයේ විස්තර කොට දක්වෙන දේපොල වලට අදලවන තාක් දුරට, 1962 වර්ෂයේ සැප්තැම්බර් මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅබ/296/සාපා.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 වැනි දින දීය.

උපලේඛනය

1. වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලයේ කම්මල් පත්තුවේ වෙන්නප්පුවේ පිහිටියා වූත්, බලයලත් මිනින්දෝරු හා මට්ටම්කරු තැන්පත් ඒ. ඇම්. පෙරේරා මහතා විසින් සකස්කරන ලද 64.12.13 දින හා අංක 6367 දරණ පිඹුරේ ඒ 2 දරණ බිම් කට්ටිය වශයෙන් දැක්වෙන්නා වූත්, උතුරෙන් : ළදරු පාඨශාලා ගොඩනැගිල්ලේ දකුණු බිත්තිය ඔස්සේ කන්‍යා මඩමට හා ඉංග්‍රීසි පාසැලට සමාන්තර ව, කන්‍යාරාමයේ කොට තාප්පය තෙක් විහිදෙන රේඛාවකින්ද, නැගෙනහිරින් : ඉහතකී 64.12.13 දින හා අංක 6367 දරණ පිඹුරේ පෞද්ගලික වාසස්ථාන වශයෙන් පෙන්වා තිබෙන කොටසින්ද, දකුණෙන් : ඉහත කී 64.12.13 දින හා අංක 6367 දරණ පිඹුරේ කන්‍යා මඩම සහ පෞද්ගලික වාසස්ථාන වශයෙන් පෙන්වා තිබෙන කොටසින් ද, බටහිරින් : ඉහත කී 64.12.13 දින හා අංක 6367 දරණ පිඹුරේ පෞද්ගලික වාසස්ථාන වශයෙන් පෙන්වා තිබෙන කොටසින් ද, මායිම් වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වෙනි ඡෙදයෙහි වෙසෙසා දක්වෙන ඉඩමේ පිහිටි සියළුම ගොඩනැගිලි හා නිර්මාණයන්.

10–546/4

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය යි

### මන්/පෑ ඩිවිරිච්චාන් රෝ. ක. දෙමළ මිශ්‍ර පාසැල, මඩුපල්ලිය

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේ ලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති බලතල අනුව, ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ නොවැම්බර් මස 14 වෙනි දින අංක 13,393 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 2161 දරණ පැවරුම් නියෝගය, මෙහි පහත දක්වෙන දේපොලවලට අදළවනතාක් දුරට, 1965 ජූනි මස 18 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජීඑස්/එන්එස්ඒඑච්/481,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 වැනි දින දීය.

උපලේඛනය

උතුරු පළාතේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ, මනතයි ආදයම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයේ, පලම්පිඩ්ඩි ගම්මුලාදැනි වසමේ, සූලෙනා මරුතමඩු නම් ගමෙහි පිහිටි මඩු පල්ලියේ ඉඩමයයි කියනු ලබන ඉඩමෙන් (නැගෙනහිර සිට බටහිරට) යාර 100ක් පමණ වූ ද, (උතුරේ සිට දකුණට) යාර 96ක් පමණ වූ ද, දළ වශයෙන් ආයත චතුරුශායන හැඩහුරුකමින් යුත් ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, ප. 0) තරම් වූ,

උතුරින් : දිය ඇලෙන් ද ;

නැගෙනහිරින් : රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරෙන් ද ;

දකුණින් හා බටහිරින් : මඩු පල්ලියට අයිතියයි කියනු ලබන කැලෑ ඉඩමෙන් ද, මායිම් වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයෙහි 1 වැනි ඡෙදයෙහි වෙසෙසා දක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

10–546/5

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය යි

### යා/ඩෙල්ෆ්ට් සාරපිඩ්ඩි (රෝමැනු කතෝලික) දෙමළ මිශ්‍ර පාසැල, ඩෙල්ෆ්ට්

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේ ලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, ක්‍රියා කරමින් 1962 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වෙනි දින අංක 13,314 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1906 දරණ පැවරුම් නියෝගය මෙහි පහත දක්වෙන දේපොලට අදළවන තාක් දුරට, 1965 පෙබරවාරි මස 10 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජීඑස්/එන්එස්ඒඑච්/122,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 වැනි දින දීය.

උපලේඛනය

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපත ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ ඩෙල්ෆ්ට් දූපත බටහිර පිහිටා ඇත්තාවූද සාරපිඩ්ඩි පුලාවු නමින් හැඳින්වෙන ඉඩමේ කොටසක් වූද,

උතුරෙන් : සාරපිඩ්ඩි පාර නමැති මහපාරකින් හා අම්ර්තනාදර් පොන්රෝස් නැමැත්තාට අයත් යයි කියන ඉඩම;

නැගෙනහිරින්: අම්ර්තනාදර් පොන්රෝස් නැමැත්තාට අයත් යයි කියන ඉඩම;

දකුණෙන් : කන්තර් ඉලයතම්බි, ඇස්. සුබ්‍රමණියම් සහ තවත් අයට අයත් යැයි කියන ඉඩම;

බස්නාහිරින් : ඇස්. සේතුපති සහ තවත් අයට අයත් යයි කියන ඉඩම

යන මෙකී මායිම තුළ පිහිටා ඇත්තා වූ වී. සී. ලාචම් හයක් පමණ විශාල වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වැනි ඡෙදයෙහි වෙසෙසා දක්වෙන ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

10–546/6

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**ත්‍රි/පෙරුන්තෙරු මැතෝදිස්ත මිසමේ දෙමළ මිශ්‍ර පාසැල, ත්‍රිකුණාමලය**

1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය වරයා විසින් කරනු ලැබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජීඑස්/එන්එස්ඒඑච්/601,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3,
1965 ඔක්තෝබර් මස 4 දින.

### නියෝගයයි

1962 මැයි මස 21 දින අංක 14,125 දරන ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ ත්‍රිකුණාමලේ ත්‍රි/පෙරුන්තෙරු දෙමළ මිශ්‍ර පාඨශාලාව සම්බන්ධයෙන් වූ 1962 මැයි මස 14 වෙනි දින අංක 1324 දරන පැවරුම් නියෝගයේ 1 වැනි ඡේදය වෙනුවට මෙහි පහත සඳහන් ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1 1960 ජූලි මස 21 දින ත්‍රිකුණාමලේ ත්‍රි/පෙරුන්තෙරු දෙමළ මිශ්‍ර පාඨශාලාව පවත්වා නඩත්තු කරනු ලැබූ ස්ථානය, එනම්, බලය ලත් මැනුම්කරු හා මට්ටම්කරු තැන්පත් ආර්. මුරුගුපිල්ලේ මහතා විසින් සාදන ලද 1934.1.31 දින හා අංක 513 දරන පිඹුරේ ඒ, බී සහ ඩී යන අක්ෂර වලින් දක්වා ඇත්තා වූ ද, නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරයේ අංක 5 දරන කොට්ඨාශයේ පිහිටා ඇත්තාවූ ද,

උතුරෙන් : ආර්. සතාසිවම් මහත්මිය සතු දේපළින් හා වයිරවර් කෝවිල් භූමියෙන් ද ;

නැගෙනහිරින් : ඇස්. සිවානන්දන් මහත්මිය සතු දේපළින් ද ;

දකුණෙන් : මහවීදියෙන් ද ;

බස්නාහිරින් : රාජවරෝදයම් පාරෙන් හා මැතෝදිස්ත දෙවස්ථානය සතු වරිපනම් අංක 80 දරන ස්ථානයෙන් ද, හා ඉහත කී අංක 513 දරන පිඹුරේ "සී" ඉඩම් කොටසින් ද

මායිම් වූ රූඩ් දෙකකුත් පර්චස් විසිඅටයි දශම දෙකක් (අ. 0, රූ.2. ප.28.2) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

ඉහත කී අංක 513 දරන පිඹුරෙහි "සී" ඉඩම් කැබෙල්ලේ පිහිටා ඇති ළිඳ සැමවිටම පාවිච්චි කිරීමේ පූර්ණවූත් අයිතිය, නිදහස හා බලය.

10–546/7

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් සෝමපාල ගුණධීර වන මම, 1965 වර්ෂයේ අප්‍රේල් මාසයේ 2 වෙනි දින අංක 14,368 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද කළු/මග්ගොන ශාන්ත වින්සන්ති පිරිමි පාසලට අයත් සියළුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට බෙරුවල මාණ්ඩලික පාඨශාලා පරික්ෂක තැන්පත් ඇන්තනි ජෝන් ද සිල්වා මහතාට මෙයින් බලය පවරමි.

2. එකී ඇන්තනි ජෝන් ද සිල්වා මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඩුවමට භාජන කරනු ලැබිය හැකිද වේ.

සෝමපාල ගුණධීර,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

ජාපාඅළ/934,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1965 ඔක්තෝබර් මස 6 වෙනි දින දීය.
10–547/1

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

බෙරුවල මාණ්ඩලික පාඨශාලා පරික්ෂක තැන්පත් ඇන්තනි ජෝන් ද සිල්වා වන මම, 1965 වර්ෂයේ අප්‍රේල් මාසයේ 2 වෙනි දින අංක 14,368 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද කළු/මග්ගොන ශාන්ත වින්සන්ති පිරිමි පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 25 වෙනි දින පෙරවරු 10 ට, එකී කළු/මග්ගොන ශාන්ත වින්සන්ති පිරිමි පාසලේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළුදෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

2. එම දේපලට අයිතිවාසිකමක් ඇති සියළු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත් සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

ඇන්තනි ජෝන් ද සිල්වා,
බෙරුවල, මාණ්ඩලික පාඨශාලා පරික්ෂක.

1965 සැප්තැම්බර් 20 වෙනි දින,
බෙරුවල දීය.

10–547/2

---

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණයකි